# නිවටයෝ

හමුදා මූලස්ථානය සම්බන්ධ කොටි ත්‍රස්තවාදී ප්‍රහාරයට නෝර්වේ ඇතුළු බටහිර ක්‍රිස්තියානි රටවල්, මෙරට රාජ්‍ය නොවන සංවිධානවල කුලියට වැඩ කරන්නන්, සම්භාව්‍ය කලාකරුවන් නමින් බටහිරින් ලැබෙන කුලියට සිනමාව, කලාව උපයෝගී කර ගනිමින් බටහිර ගැති දේශපාලනයක් කරන්නවුන් කවදාවත් ඇති නොවන ඊනියා සාමයක් ගැන කුලියට හා පොරත්වය සඳහා කෑ ගසන්නන්, නිවට දේශපාලකයන්, ඊනියා සාමය ගැන බොරු දොඩවන පල්ලි නිකායේ භික්ෂූන් ඇතුළු ඇතැම් පූජකවරුන්, බටහිර සංස්කෘතික යටත්විජිතවාදයේ සේවකයන් වූ මාක්ස්වාදීන්, පශ්චාත් මාක්ස්වාදීන් ඇතුළු සියලු පශ්චාත්වාදීන් හා සිංහල විරෝධී ජඩමාධ්‍යකරුවන් ද වගකිව යුතුය. මේ නඩය දැනටමත් තම සුපුරුදු යාඥාව අරඹා ඇත. ඔවුන් ඉල්ලා සිටින්නේ කෙසේ හෝ මේ අවස්ථාවේදී කොටි සාම සාකච්ඡා සඳහා සහභාගි කරවා ගැනීමටත්, යුදවාදීන්ට කිසිදු ඉඩක් නොදීමටත් කටයුතු කරන ලෙසය. ඒ අතර සුපුරුදු පරිදි ඔවුන්ගෙන් ඇතමකු ඝාතන හෙළා දැකීමට ද ඉදිරිපත් වී ඇත. ඇතමකු කියනු ඇත්තේ තවමත් ඝාතකයන් කවුරුන්දැයි හඳුනාගැනීමට නොහැකි බවය. බටහිරයන් කොටි ඝාතන ගැන කලකිරී අපට සහයෝගය දක්වන තෙක් බලා සිටීම කළුනික සෙවීමකි. කොටි බෝම්බ පුපුරවන්නේ ම බටහිරයන්ගේ සහයෝගය ඔවුන්ට ලැබෙන බැවිනි. බටහිරයන් කොටි ඝාතන හෙළාදැකීම බයිලා කීමක් පමණකි. මෙරට බටහිර ගැති නිවට අධ්‍යාපනය විසින් බිහිකෙරී ඇති නිවට නායකයන් එදා සිටම කල්පනා කෙළේ ඉංගිරිසින් ඇතුළු බටහිරයන් සතුටු කිරීමට මිස රටේ ස්වාධීනත්වය රැක ගැනීමට නොවේ. එදා සිටි නායකයන් මෙරටට නිදහස ඉල්ලා කියා සිටියේ ඔවුන්ට සුද්දන් මෙන් වැඩ කළ හැකි බවය. නිදහසක් දිනා නොගත් එහෙත් සුද්දන්ට බැගෑපත් වී බාග නිදහසක් හිඟාගත් නායකයන්ට රැක ගැනීමට තිබූ නිදහස කුමක්ද? මේ නායකයෝ බ්‍රිතාන්‍යන් විසින් පත් කරනු ලැබූ නායකයෝ වූහ. බටහිරයන් සතුටු කිරීම සඳහා කොටින්ගෙන් ඝාතනය වීමට වුව ද ඒ නායකයන්ගෙන් සංස්කෘතිකව පැවත එන්නෝ අදත් සූදානම්ව සිටිති කොටි පරාජය කළ හැක්කේ මේ බටහිර ගැති මනසින් මිදීමෙන් පමණකි.

නිවටයන් සැමදාම කියන කරුණක් නම් හමුදාව සූදානම් නැති බවය. හමුදාව බෙලහීන හමුදාවක් බවට මානසික වශයෙන් පත් කිරීමට සාම පූජකයන් ඇතුළු ඊනියා ගැටුම් නිරාකරණය කරන්නන් කටයුතු කරන බව සැබෑය. විශ්වවිද්‍යාලවල ගැටුම් ඇති වන අවස්ථාවල පැත්ත පළාතේ නොඑන ගැටුම් නිරාකරණ කථිකාචාර්යවරු හමුදා කඳවුරු ගානේ ගොස් හමුදාවට නිවටයන් වන සැටි කියා දෙති. එහෙත් මෙරට හමුදාව ඔවුන් සිතන ආකාරයේ නිවටයන් රැළක් නොවේ. කරුණා පරාජය කිරීමට නොහැකි කොටි කැණහිළුන්ට ලැබෙන පුහුණුවට වඩා හොඳ පුහුණුවක් මෙරට ත්‍රිවිධ හමුදාවටත්, පොලිසියේ විශේෂ කාර්ය බලසාධකයටත් ලැබෙයි. මේ කණ්ඩායම් අතර ඒකාග්‍රතාවකින් ක්‍රියාකිරීමට සුදුසු හමුදා නායකයන් (පරණ ආයුධ මිලදී ගන්නා කොමිස් කාක්කන් නොව) පත්කර හමුදාවල මානසික තත්ත්වය ඉහළ මට්ටමකට ගෙනැවිත් බටහිරයන්ට නොනැමී එක වේලක් හැර එක වේලක් කා හෝ හමුදා ක්‍රියාමාර්ගයකින් කොටි පරාජය කිරීමට වහා කටයුතු කළ යුතුය. අද අවශ්‍ය වී ඇත්තේ බටහිරයන්ගේ බලපෑම් හමුවේ දණ නොනමන අදීන නායකයන් පමණකි. මෙරට ඊනියා සාමයක් ගැන කතා කරන්නෝ බටහිර ගැති නිවටයෝය. හමුදාවේ මානසිකත්වය වර්ධනය නොකර කිසිවක් කළ නොහැකිය. ඒ සඳහා කඳවුරක් කඳවුරක් ගානේ යෑමට කැමති පිරිස් බටහිර රටවලින් ආධාර ලබන රාජ්‍ය නොවන සංවිධානවල නැතිවාට මෙරට ඕනෑ තරම් සිටිති.

අප කලක් තිස්සේ කියන බටහිර උග්‍ර බලපෑම් තවමත් මෙරට එතරම් කතාබහට ලක් නොවීම කනගාටුවට කරුණකි. මෙරට දෙමළ ජාතිවාදය බටහිරයන්ගේ නිර්මාණයකි. ඔවුන් ඒ නිර්මාණය කළේ සිංහලයන්ට විශේෂයෙන්ම සිංහල බෞද්ධයන්ට විරුද්ධවය. මෙරට දෙමළ ජාතිවාදය අද පවත්වා ගෙන යනු ලබන්නේ බටහිරයන් විසින්ය. නෝර්වේ යනු බටහිරයන් වෙනුවෙන් සෘජුව ඉදිරිපත් කෙරෙන රට පමණය. නෝර්වේ පිටුපස ඇති බටහිර අනෙක් ක්‍රිස්තියානි රටවල් හැඳින නොගෙන අපට ඉදිරි ගමනක් නැත. අදවත් ආණ්ඩුව මේ ගැන නොසිතන්නේ නම් ඒ ඉතා භයානකය. බටහිරයන්ගෙන් ආණ්ඩුවට වන බලපෑම හොඳින්ම දන්නේ ආණ්ඩුව ය. ආණ්ඩුව ගත්කටට ම එවැනි බලපෑමක් නැතැයි කියනු ඇත. ඒ බයිලාවලින් වැඩක් නැත. ආණ්ඩුවට ඊනියා සාමයක් ගැන මෙතරම් කරදර වීමට වූ ප්‍රධාන හේතුව බටහිර ක්‍රිස්තියානි රටවල්ය. කොෆී අනන්ගේ සිට බුෂ්ගේ සිට බ්ලෙයාර්ගේ සිට මෙරට සිටින ඊනියා සම්භාව්‍ය කුලීකාර දේශපාලනයක් කරන සිනමා රොඩ්ඩන් දක්වා, සිංහලත්වයට එරෙහිව ලියන ජඩමාධ්‍යකරුවන් දක්වා මේ සියල්ලන්ටම ඊනියා සාමයක් සටන් විරාමයක් හා සාම සාකච්ඡා අවශ්‍ය ය. ඊනියා සාමය යනු අවසානයේදී ඊළම ලබා

© Prof. Nalin De Silva

දී කොටි ප්‍රහාර තාවකාලිකව නැවැත්වීමය. එහෙත් ඉන්පසු දේශ සීමා අරගල ඇති වනු ඇත. සටන් විරාමය යන්නෙන් අදහස් කරන්නේ කොටින්ට හිතු හිතු අයුරින් පහරදීමට අවස්ථාව සලසා දීමත්, හමුදාව බැරැක්කවලට සීමාකර වෙඩි කන්නට සැලැස්වීමත්, අසරණ සිංහලයන් පැහැර ගෙන ගොස් අවශ්‍ය නම් මරා දැමීමට ඉඩ සැපයීමත්ය. ඊනියා සාම සාකච්ඡා යනු කොටින්ට සටන් කර ලබා ගැනීමට නොහැකි ඊළම මේසය උඩින් ලබාදීමය.

දෙවැනි ඊළාම් යුද්ධය යන සටකපට වදන්වල නිර්මාතෘවරයා වූයේ එක්තරා ඉංගිරිසි පත්‍ර සංස්කාරකවරයෙකි. ඊනියා යුද්ධ දෙකක් අතර සටන් විරාමයක් වේ ය යන අදහස ද මේ වචනවල වෙයි. පසුගිය වසර ගණනාවක් තිස්සේ මෙරට කිසි දිනෙක ඊනියා සටන් විරාමයක් හෝ යුද්ධයක් හෝ තිබී නැත. තිබී ඇත්තේ කොටි විටින් විට කරන බෝම්බ ප්‍රහාරය. හමුදාව ඉදහිට කරන්නේ මේ ප්‍රහාරවලට ප්‍රතිප්‍රහාර දීමක් පමණකි. කොටි බෝම්බ ප්‍රහාර ඇතැම් කලක නිරතුරුව පැවතෙයි. එවිට අපි එයට යුද්ධය යැයි කියමු. අනෙක් කාලවල කරන ප්‍රහාරවලට සටන් විරාමය යැයි කියමු. මේ බහුබූත සංකල්පවලින් අප රැවටිය නොහැකිය. අද හොඳින් තේරුම් ගත යුතු කරුණක් නම් කරුණා පරාජය කිරීමට නොහැකි කැණහිළුන්ට ලංකාණ්ඩුවේ හමුදාව පරාජය කිරීමට කිසිසේත් නොහැකි බවය. ඊනියා සාම සාකච්ඡා යනු සටන් කර දිනාගත නොහැකි ඊළම සාකච්ඡාවෙන් ලබා ගැනීමේ මාර්ගයක් වෙයි. මේ කසිකබල් සාමය සඳහා කැපවීමට අපට අවශ්‍ය නැත. අපට අවශ්‍ය රට ජාතිය හා සමය වෙනුවෙන් කැපවීමය. අපට අද සාමය රැකීමක් ගැන තොරතෝංචියක් නැතිව කියවීමට සිදුවී ඇත්තේ බටහිරයන්ගේ, ඊනියා ජාත්‍යන්තර ප්‍රජාවගේ සිත් සතුටු කිරීමටය. ඊනියා යථාර්ථයක් ය කියමින් අප බටහිරයන්ට වැඳවැටිය යුතු නොවෙයි. මේ කසිකබල් දේශපාලන යථාර්ථය යන වදන් ද බටහිරයන්ගේ නිර්මාණ වෙයි. බටහිර සංස්කෘතික, ආර්ථික හා දේශපාලනික යටත්විජිතවාදය යථාර්ථයක් යැයි කියමින් එයට විරුද්ධව කටයුතු නොකරන්නෝ නිවටයෝය.

බටහිරයෝ ආණ්ඩුවට ඉවසීම පිළිබඳ සහතික දෙති. මේ සහතික එකකවත් කොටි ප්‍රහාරවලින් මියගිය අයගේ දෙමවුපියන්ට, බිරියන්ට දරුවන්ට තඹ දොයිතුවක ද වටිනාකමක් නැත. ඒ සහතික සෝල්හයිම්ලා බිත්තියේ හෝ වෙනත් ඕනෑම තැනක ගසා ගත්තාට අපට කමක් නැත. ආණ්ඩුවට සහතික දෙන බටහිරයන් කිසි දිනෙක කොටින්ට දඬුවම් කර ඇත්ද? බටහිරයන් වැඩිම වුවහොත් කරන්නේ කොටි ප්‍රහාර හෙළාදැකීම පමණකි. අද ආණ්ඩුව බොහෝ අවස්ථාවල කොටි පහර දුන්න ද නිසොල්මනේ සිටීමට හමුදාවට අණ කර ඇත. ඉදහිට පමණක් ප්‍රති ප්‍රහාර එල්ල කරයි. සාම්පූර් කඳවුරට පහරදීමට හමුදාවන්ට හැකිනම් මනා සූදානමකින් පසු සියලු කොටි කඳවුරු විනාශ කිරීමට හමුදාවන්ට හා පොලිස් කාර්ය බලසාධකයට හැකි බව අමුතුවෙන් කිව යුතු නොවෙයි. බටහිරයන්ට අවශ්‍ය නම් ඔවුන් අප රටට තහංචි පනවනු ඇත. එහෙත් තහංචි පනවා අප විනාශ කිරීමට බටහිරයන්ටවත්, ඔවුන්ගේ සහචරයන්ටවත් නොහැකිය. කුසගින්නේ සිට හෝ කොටි හා බටහිරයන් පරාජය කිරීමට අපි කැපවෙමු.

හරි වුවත් වැරදි වුවත් ඊශ්‍රායලය පලස්තීනයේ හා වෙනත් අරාබි ප්‍රදේශවල පිහිටි කඳවුරුවලට පහර දෙන විට බටහිර ක්‍රිස්තියානි රටවල් මුවින් නොබැණ ඒ අනුමත කරයි. ඒ මුස්ලිම් සංස්කෘතිය පැරදවීමටය. යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය රැකීමටය. එහෙත් අප රටේම ඇති බටහිර ක්‍රිස්තියානි සංස්කෘතිය වෙනුවෙන් සේවය කරන කොටින්ගේ කඳවුරුවලට පහරදීම ඊනියා සටන් විරාමයක නාමයෙන් අපට අකැපය. බටහිරයන්ට කුදගසා ගැනීමට කියා අප අද කළ යුත්තේ කොටි පහර දෙන තුරු බලා සිටීම නොව සොය සොයා කොටි කඳවුරුවලට පහරදීමය. බටහිරයෝ කොටි ත්‍රස්ත ප්‍රහාර වැළැක්වීමට පියවර නොගනිති. එයට අනුබල දෙති. ඒ ප්‍රහාර වැළැක්විය හැක්කේ කොටි කඳවුරුවලට පහරදීමෙන් පමණකි. එදා ජවිපෙ සමග සාකච්ඡා කළ යුතු යැයි කී සුද්දකු නැත. මේ සියල්ලෙහි පිටුපස ඇත්තේ යමකු යම් ප්‍රහාරයක් පිටුපස ඇති සංස්කෘතික දේශපාලනික ප්‍රවාහය අනුමත කරන්නේ ද නැත්ද යන්න පමණකි. බටහිර ක්‍රිස්තියානි රටවල් තම යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට දේශපාලනයට හා ආර්ථිකයට සේවය කරන ඊශ්‍රායලයත් කොටිත් ආරක්‍ෂා කරයි. කොටි ආරක්‍ෂා කිරීම සඳහා ඔවුන් යොදා ගන්නා හේතුව වී ඇත්තේ දෙමළ ජනයාට අසාධාරණයක් වී ඇත යන්නය. මේ ඊනියා අසාධාරණය යනු බටහිරයන් සිංහලත්වයට එරෙහිව දෙමළ ජාතිවාදය ඇතිකර දෙමළ ප්‍රභූන්ට දී ඇති වරප්‍රසාද කිහිපයක් ඉවත් කිරීම පමණක් බව බටහිරයෝ ද දනිති. එහෙත් ඔවුහු ඒ සම්බන්ධයෙන් පැස්බර පිළිවෙත අනුගමනය කරති. අපි තව තවත් බටහිර බලපෑම් ඉදිරියේ නිවට වෙමුද? බටහිරයන්ට තව තවත් බැගෑපත්වීමෙන් අපට අත්වන ඊනියා සාමයක් නැත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva